**සී/ස බී.සී.සී.ලංකා සමාගම - 2024/ 2025**
-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස බී.සී.සී.ලංකා සමාගමේ ("සමාගම") 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 මාර්තු 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 ප්‍රකාරව සමාගම විසින් 2025 මාර්තු 31 දිනට විලම්බිත බදු වත්කම් හෝ වගකීම් ගණනය කර ගිණුම්වලට ගලපා නොතිබුණි. | 2025/2026 වර්ෂයේදී ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 ප්‍රකාරව විලම්බිත බදු වත්කම් හෝ වගකීම් ගණනය කර ගිණුම්වලට ගැලපිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව භාවිතා කරනු ලබන වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර ඇස්තමේන්තුවල වෙනස්කම් ඇත්නම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කල යුතු වුවද, 2025 මාර්තු 31 දිනට ලියාහල අගය රු.11,456,522 ක් වූ වත්කම් වර්ග 06 ක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය එසේ ඇස්තමේන්තු කර ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් වල තක්සේරු අගයන් ලබාගෙන ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති ප්‍රකාරව ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව භාවිතා කරනු ලබන වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර වටිනාකම ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශනවල ඊට අදාල ගැලපීම් සිදු කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79(ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.78,882,933 ක් වූ වත්කම්වල දළ ධාරන අගය මූල්‍ය | සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති දේපල පිරියත හා උපකරණ නැවත අගය කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හරහා තක්සේරු | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 79 (ආ) ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ඉල්ලීමක් කර ඇත. | වත්කම්වල දළ ධාරන අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඈ) | සමාගමට අයත් පොත් අගය රු.3,840,056,229ක් වූ අක්කර 06 ක බිම් කොටසක් අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි 2019 වර්ෂයේදී අධිකරණ අමාත්‍යාංශය වෙත පවරා දී තිබුණි. ඒ සඳහා 2022 නොවැම්බර් 04 දිනැතිව සිදු කර තිබූ කොළඹ දිස්ත්‍රික් ප්‍රධාන තක්සේරුකරුගේ රු.7,229,173,000ක වන්දි තක්සේරු මුදලින් අධිකරණ අමාත්‍යාංශය වෙත වෙනත් ගනුදෙනුවක් වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු.21,608,510ක ශේෂයක් අඩු කර රු.7,207,564,490ක ශේෂයක් ලැබිය යුතු වන්දි මුදලක් ලෙසද,වත්කම ඉවත් කිරීමේ ලාභ රු.3,389,116,771ක් රඳවාගත් ඉපයීම් වලට බැර කිරීම වෙනුවට ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙසද 2024 වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි.ඉකුත් වර්ෂයේ විගණනයේදී පෙන්වා දී තිබූ මෙම දෝෂය නිවැරදි කර නොතිබීමෙන් ප්‍රත්‍යාගණන සංචිතය රු.3,389,116,771ක් වැඩියෙන්ද රඳවාගත් ඉපයීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද තවදුරටත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද තක්සේරු කරන ලද වන්දි මුදල 2026 මාර්තු 31 දින වන විටත් සමාගමට ලැබී නොතිබුණ අතර එම මුදල් ලැබීමේ අවදානමක් නිරීක්ෂණය වුවද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | 2025 ඔක්තෝබර් 03 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී ඉඩම සඳහා ලැබිය යුතු වන්දි මුදල වන රු.7,229,173,000 ලබා දෙන බව තීරණය කර එහි සාකච්ඡා සටහන් විධිමත්ව එවා තිබුණි. එම වන්දි මුදල ලබාදෙන බවට නැවත කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් කර ඇත. වන්දි මුදල ලැබීම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කලයුතු වෙනස්කම් ඉදිරි ගිණුම් වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉකුත් වර්ෂයේදී විගණනය විසින් පෙන්වා දී තිබූ ගිණුම්කරණ දෝෂ නිවැරදි කර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |

**1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සහ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් බැහැරව සමාගමේ නිෂ්පාදන දිවයින පුරා බෙදාහැරීමේ සම්බන්ධීකරණ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීමට පෞද්ගලික සමාගමක් සමඟ 2024 ජනවාරි 04 දින සිට ගිවිසුම්ගත වී තිබුණි. 2024 අප්‍රේල් 01 දින සිට සැප්තැම්බර් 30 දක්වා කාලය සඳහා රු.3,195,539 ක් අදාළ සමාගම වෙත විකුණුම් කොමිස් වශයෙන් ගෙවා තිබුණි. | මෙම ආයතනයේ සම්බන්ධීකරණයෙන් පසුගිය මාස 10 තුළ රු .මිලියන 90 ක අලෙවි ආදායමක් උපයා ගැනීමට හැකි වී ඇත. කෙසේ නමුත් මෙම ගිවිසුම 2024 දෙසැම්බර් 30 දිනෙන් අවසන් කර ඇත. | සේවා ගිවිසුම් වලට ඇතුලත්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතු අතර ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.1,814,276ක් වූ වෙළෙඳ ලැබිය යුතු ශේෂ අය කරගෙන නොතිබුණි. | වසරකට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.1,814,276ක් වූ ලැබිය යුතු ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ශේෂ නොපමාව අය කර ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 10ක් ඉක්ම වූ රු.3,976,442ක ගෙවිය යුතු ශේෂ නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු රු.397,442ක මුදල කපා හැරීමට ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුවේද, අධක්ෂක මණ්ඩලයේද අනුමැතිය හිමි වූ අතර, ඒ සම්බන්ධයෙන් නිර්දේශ ලබාගැනීමට අමාත්‍යාංශ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාට ලිඛිතව දැනුම් දී ඇත. | ගෙවිය යුතු ශේෂ නොපමාව නිරවුල් කළ යුතුය. |

### 1.6.3 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල රු.539,148,850ක් පිරිවැය වූ පිරිපහදු නොකළ පොල්තෙල් මිලදීගෙන තිබුණු අතර ඉන් පිරිවැය රු.513,854,320ක් එනම් මුළු මිලදී ගැනීම්වලින් සියයට 95ක් එක් සැපයුම්කරුවෙකුගෙන් මිලදීගෙන තිබුණි. ඒ අනුව සමාගමේ ප්‍රධාන නිෂ්පාදනය වන පිරිපහදු කළ පොල්තෙල් නිපදවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී එක් සැපයුම්කරුවෙකු වෙත විශාල වශයෙන් රඳාපැවතීම තුළ සමාගමේ මෙහෙයුම් කටයුතුවල පැවැත්ම සම්බන්ධව අවධානමක් පැවතුණි. | අදාල ප්‍රමිතිය සහිත සැපයුම්කරුවන් 12ක් පමණ ලංකාව තුල පොල්තෙල් නිෂ්පාදනය කලත් ඉන් වැඩි ප්‍රමාණයක් පොල්තෙල් අපනයනකරුවන් වන අතර දේශීය වෙළඳපලට පොල්තෙල් සැපයුම් කරන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. නමුත් දැනට තෙල් සැපයුම්කරුවන් දෙදෙනෙකු මඟින් පොල්තෙල් මිලදී ගනු ලබයි. | අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී එක් සැපයුම්කරුවෙකු වෙත විශාල වශයෙන් රඳාපැවතීමෙන් වැළකිය යුතුය. |

### 1.6.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත | | | |
| **3.2 වගන්තිය** | සමාගමේ බඳවා ගැනීමේ පරිපාටිය 2025 මාර්තු 31 දින වන විටත් | මෙම ආයතනය සඳහා බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා | සමාගමේ බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරවාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අනුමත කර නැත. | සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කරවා ගත යුතුය. |
| **3.2 වගන්තිය** (අ) | වැටුප් ව්‍යුහයන් හා දීමනා ගෙවීමට අදාළ ඉල්ලීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට ඉදිරිපත් කළයුතු වුවද එවැනි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා නොගන්නා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් 03 දෙනෙකු සඳහා රු.801,000 ක ප්‍රවාහන දීමනාවක් ද සේවකයින් 48 දෙනෙකු සඳහා රු.4,071,375 ක පැමිණීමේ දීමනාවක්ද සේවකයින් 03 දෙනෙකු සඳහා රු.108,000 ක අවදානම් දීමනාවක්ද ගෙවා තිබුණි. | ආයතනය සතු වාහන අපහරණය කිරීමට සිදු වීම, රියදුරන් ප්‍රමාණවත් නොවීම, කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දීමේදී විවිධ ප්‍රදේශයන්හි පදිංචි වීම, රාජකාරී වේලාවන්හි වෙනස්කම්, ආදී ගැටලු මෙන්ම ඉන්ධන, රියදුරු අතිකාල හා වාහන නඩත්තු වියදම් අවම කර ගැනීම සඳහා පොදු ප්‍රවාහන සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුව වඩා අරපිරිමැසුම්දායක ලෙස මෙම ප්‍රවාහන පහසුකම සැලසීම සඳහා මෙම නිලධාරීන්ට බාහිර කාර්යාල ප්‍රවාහන පහසුකම් සේවාව මඟින් සේවාව සපයාගෙන ආයතනයට පැමිණීමට අවස්ථාව සලසා මෙම ගෙවීම කර ඇත. | වැටුප් ව්‍යුහයන් හා දීමනා ගෙවීමට අදාළ ඉල්ලීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | PL-1 සේවා ගණයෙහි පිහිටුවා සිටි සේවකයින් 04 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව PL-2 හා PL-3 සේවා ගණවලට උසස් කර 2024 ජූලි සිට 2025 මාර්තු මාසය දක්වා මූලික වැටුප වශයෙන් එකතුව රු.965,340ක් ගෙවා තිබුණි. | සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කරන ලෙස ඉල්ලා සකස් කළ කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. එකී අනුමැතිය ලැබීමෙන් අනතුරුව කාර්ය මණ්ඩලය හා බඳවා ගැනීමේ පරිපාටි හා පාරිශ්‍රමික ගෙවීම් පිළිබඳව අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරමි. | සේවා ගණවලට උසස් කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| 6.6 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2025 මැයි 31 දින විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් මාස 07ක ප්‍රමාදයකින් පසු 2025 දෙසැම්බර් 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඒ සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය පත් කිරීම සම්බන්ධයෙන් පැවති ගැටලු හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන නිශ්චිත කාලයේදී අනුමත කර ගැනීමට නොහැකි වූ අතර 2025 දෙසැම්බර් 17 වන දින පැවැති අධක්ෂක මණ්ඩල රැස්වීමේදී අනුමත විය. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් තුළ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා කෙටුම්පත විගණනයට ඉදිරිපත් කිරීමට කළමණාකරනය විසින් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 103,333,611 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.155,729,211 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.52,395,600 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව පිරිපහදු ආදායම රු.143,601,272 කින් වැඩිවී සහ බෙදාහැරීමේ වියදම රු. 9,912,117 කින් අඩුවී තිබුණද, සබන් විකුණුම් හා මූල්‍ය ආදායම පිළිවෙලින් රු.66,361,779 කින් සහ රු.15,391,051 කින් අඩුවීම මෙන්ම විකුණුම් පිරිවැය රු116,303,013 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා සමාගම අතර ඇතිකර ගෙන තිබූ ගිවිසුමක් ප්‍රකාරව 1988 වර්ෂයේ සිට මාසිකව ගෙවල් කුලී ගෙවමින් පැවති ගුණසිංහපුර ඩයස් පෙදෙසේ නිවසක 1998 වර්ෂයේ සිට අනවසර පදිංචිකරුවකු පදිංචි වී තිබුණද එම පදිංචිකරු ඉවත්කර නිවසේ භුක්තිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාගමට නෛතික ක්‍රියාමාර්ගයකට එලඹීමට සිදුවන අතර එය දීර්ඝ ක්‍රියාවලියක් වන බැවින් දැනට කුලී මුදල ගෙවීම අත්හිටුවා ඇත. ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් විමසා මෙම ගැටලුව විසඳා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අනවසර පදිංචිකරු ඉවත්කිරීමට නිවාස සංවර්ධන ධිකාරිය හා සම්බන්ධව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් ගොඩනැගිලි පරිශ්‍ර 28ක් ගබඩා හා කාර්යාල පවත්වාගෙන යාම සඳහා බාහිර පාර්ශවයන් | 2025 අප්‍රේල් මස සිට ගබඩා වර්ග අඩියක් සඳහා රු.80ක් ද කාර්යාල පහසුකම් වර්ග අඩියක් සඳහා රු.100ක් ද වශයෙන් මිල වැඩි කල අතර 2025 | කුලී පදනමින් ලබාදී ඇති පරිශ්‍ර සඳහා වෙළඳපල තක්සේරු ලබාගෙන කුලී |

| | | |
|---|---|---|
| වෙත කුලී පදනමින් ලබාදී තිබූ අතර එයින් පරිශ්‍ර 20ක් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී 2017 වර්ෂයෙන් පසු අදාළ පරිශ්‍ර සඳහා වෙළඳපල තක්සේරු වටිනාකම ලබාගෙන ඒ අනුව කුලී ගිවිසුම් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සැප්තැම්බර් මස සිට ගබඩා වර්ග අඩියක් සඳහා රු.100ක්ද කාර්යාල පහසුකම් වර්ග අඩියක් සඳහා රු.120ක්ද ලෙස නැවත මිල වැඩි කරන ලදී. 2026 පෙබරවාරි මස දෙවන දින නැවතත් තක්සේරු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය මඟින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලිඛිත ඉල්ලීමක් කර ඇත. | ගිවිසුම් සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම පොල්තෙල් ඇතුළු නිෂ්පාදිත 9ක් නිෂ්පාදනය කර අලෙවි කළ ද, පොල්තෙල් නිෂ්පාදනය හැර කිසිදු නිෂ්පාදිතයක් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබාගෙන නොතිබුණි. | ප්‍රමිති සහතික ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා නිෂ්පාදන අංශ නවීකරණය කළයුතු අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන නිලධාරීන් කර්මාන්තශාලාවට පැමිණ මූලික නිරීක්ෂණ කටයුතු කර ඇත. | සියලු නිෂ්පාදිතයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතිකය ලබාගත යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මගින් සමාගම වෙත ලබා දී තිබුණු වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඉඩමක නීත්‍යානුකූල අයිතිය පවරා දෙන ලෙස සමාගම විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් ඉල්ලා තිබූ අතර සමාගමේ ප්‍රධාන කාර්යාලයේ පැවති සබන් නිෂ්පාදන යන්ත්‍රාගාරය 2012 වර්ෂයේ දී මෙම භූමියෙහි ස්ථාපනය කර තිබුණි. එසේ වුවද, ඉඩම පැවරීම සඳහා බදු පාරිතෝෂිකය (Lease Premium) සහ බිම් කුලිය (Ground Rent) වශයෙන් අක්කර 01ක් සඳහා වසරකට ඇමරිකානු ඩොලර් 5,130ක් ගෙවිය යුතු බව හා ඉඩම පැවරීමට අදාළ නීතිමය කටයුතු අවසන් වන තෙක් අක්කර 01ක් | පසුගිය කාලය තුළ ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට හඳුනාගත් ආයතනයක් ලෙස මුදල් අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබීම හේතුවෙන් දෛනික මෙහෙයුම් වලට පමණක් සීමා වීම මත මේ සම්බන්ධයෙන් නිසි අවධානයක් අමාත්‍යාංශ මට්ටමින් සිදු නොවූ අතර මෙම ආයතනය නැවත කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත් කිරීමෙන් පසු පත්කළ නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ පවරා ගැනීම් නිරවුල් කිරීමට යෝජනා සම්මත කර ඇත. | සමාගමේ වත්කම් ආදායම් ඉපයීම සඳහා කාර්යක්ෂමව යොදවාගත යුතුය. |

සඳහා මාසිකව ඇමරිකානු ඩොලර් 567ක් බැගින් ගෙවන ලෙස මණ්ඩලය සමාගම වෙත දන්වා තිබුණි. සමාගමේ මූල්‍ය තත්ත්වය අයහපත් වීම මත අදාළ ගෙවීම සිදු කිරීමට සමාගම අපොහොසත්ව තිබූ අතර ඉඩමේ ස්ථාපනය කර තිබූ සබන් සහ අනෙකුත් සේදුම්කාරක නිෂ්පාදන කර්මාන්තශාලාව විගණිත දිනය වූ 2025 මාර්තු 31 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි.